**දකුණු පළාත් සභාව - 2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දකුණු පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 08 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දකුණු පළාත් සභා අරමුදල**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් සභාවේ ආයතන 03 ක් සඳහා පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.22,694,340 ක වත්කම් සහ ආයතන 03 ක් විසින් දරා තිබූ රු.10,323,113 ක ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත නොකිරීම නිසා පළාත් සභා අරමුදල් ගිණුමේ දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු.33,017,453 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ආයතනය සතු සියළු ස්ථාවර වත්කම්වල වටිනාකම් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කරන ලෙසත් අදාල අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසත් අදාල ආයතන වෙත දන්වා යැවීමට කටයුතු කරන බව. | දේපල පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව උකස් ආයතනයන්ගෙන් අයකර ගෙන තිබුණු ආපසු ගෙවිය යුතු රු.27,550,000 ක් වූ ඇප තැන්පත් මුදල් සහ ඒ සඳහා වූ පොලී ආදායම ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. ඒ සඳහා ලද පොලී ආදායම, ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබීම නිසා ඉකුත් වර්ෂ සඳහා ලද පොලිය වූ රු.16,274,301 ක් සමුච්චිත අරමුදලටද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලද පොලිය රු.3,068,229 ක් වර්ෂයේ ආදායමටද ගෙන නොතිබුණි. | විගණනය විසින් නිර්දේශ කරන්නේ පොලිය ආදායම ලෙස ගත යුතු බව නම් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දකුණු පළාත් අරමුදල් ගිණුම සකස් කිරීමේදී ආදායමට ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | වත්කම්, වගකීම් හා ආදායම් සහ වියදම් නිරවුල්ව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.49,091,426,823 ක් වුවද, ප්‍රාග්ධන සංචිත ගිණුමේ ශේෂය රු.54,842,751,185 ක් වූයෙන් රු.5,751,324,362 ක වෙනසක් පැවතුණි. | ගිණුම්වල ශේෂ අතර වෙනසක් ඇතිවීම නොවැළැක්විය හැකි කරුණකි. එයට හේතුව වනුයේ පළමුව ස්ථාවර වත්කම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමේදී ස්ථාවර වත්කම් ගිණුම හර කර ඒකාබද්ධ අරමුදල් ගිණුම බැර කර ඇත. එබැවින් ප්‍රාග්ධන සංචිත ඇති නොවුණි. එමෙන්ම වත්කම් අපහරණය කිරීමේදී අපහරණයෙන් ලැබෙන මුදලට සමාන මුදලක් ප්‍රාග්ධන සංචිතයක් ගිණුමෙන් අපහරණ ගිණුමට මාරු කරනු ලබන බැවින්ද ගිණුම් ශේෂ අතර වෙනසක් පවතින බව. | නිවැරදිව ද්විත්ව සටහන් යෙදීම සිදුකළ යුතුය. දේපල පිරියත හා උපකරණවල වටිනාකම සහ ප්‍රාග්ධන සංචිත ගිණුම සැසඳීමට ලක්කළ යුතුය. |
| (iv) | පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය දැක්වීමේදී ණයගැති හා ණයහිමි ශේෂ වෙන් වෙන්ව දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.29,462,767 ක් වූ ණයහිමි ශේෂය ණයගැති ශේෂයෙන් අඩුකර දක්වා තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ණයගැති සහ ණයහිමි ශේෂ වෙන් වෙන්ව දැක්වීමට කටයුතු කරන බව. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ණයගැති හා ණයහිමි ශේෂ වෙන් වෙන්ව දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (v) | ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ (PSSP) ප්‍රතිපාදන යටතේ Civil works ලෙස 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා දරා තිබූ එකතුව රු.329,355,947 ක් වූ ප්‍රාග්ධන වියදම් වටිනාකම | ප්‍රාග්ධනිත කළයුතු සියළු ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධනිත කරන ලෙසත් අදාල වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධනිත කළ යුතු සියළුම වියදම ප්‍රාග්ධනිත කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදාළ වර්ෂයන්වලදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකිරීම නිසා දකුණු පළාත් සභා අරමුදල් ගිණුමේ දේපළ පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (vi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ගෙවිය යුතු රු.22,176,843 ක මුදල සහ වාහන අළුත්වැඩියා වෙනුවෙන් ගෙවිය යුතු රු.9,737,787 ක මුදල දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැඳීම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් දකුණු පළාත් සභා අරමුදල් ගිණුමේ උපචිත වියදම් රු.31,914,630 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කාලපරිච්ඡේදයට අදාල සියළුම බැරකම් සහ බැඳීම් වටිනාකම් නිවැරදිව හඳුනා ගෙන අදාල වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | බැඳීම් හා බැරකම් පැහැදිලිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (ශීර්ෂය 324) යටතේ අග්‍රිම පියවීම් රු.518,501 ක්ද ඇතුළුව දකුණු පළාත් අරමුදල් ගිණුමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අග්‍රිම පියවීම රු.401,793,057 ක් ලෙස දක්වා තිබුණද, පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශ අනුව අග්‍රිම පියවීම් රු.3,691,551,946 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අග්‍රිම පියවීම රු.3,691,033,445 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ නොවේ. දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශ අනුව අග්‍රිම පියවීම් රු.518,501 ක් වේ. දකුණු පළාත් අරමුදල් ගිණුමේ දක්වා ඇති අග්‍රිම පියවීම් වටිනාකම නිවැරදි බව. | අග්‍රිම පියවීම සහ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස් කරනු ලබන ප්‍රේෂණ පියවීම් පැහැදිලිව මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

### (අ) දකුණු පළාත් සභා අරමුදල

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.559,054,428 ක වෙනස්කම් | ස්ථාවර වත්කම් ලේඛනය අනුව ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අතර වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාල ආයතන වෙත දන්වා යැවීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ සැසඳීමට ලක්කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවතුණි. | | |
| (ii) | දකුණු පළාත් අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වූ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.109,047,728 ක් හා රු.9,382 ක් වූ අතර අදාළ පළාත් පාලන ආයතන විසින් සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම අගයන් පිළිවෙලින් රු.1,942,706,787 ක් සහ රු.47,114,400 ක් විය. ඒ අනුව උසාවි දඩ හා මුද්දර ගාස්තුවල එකතුව රු.1,880,764,077 ක වෙනසක් පැවතුණි. | ගෙවීමට ඇති මුද්දර හා උසාවි දඩ මුදල් පිළිබඳ ලේඛන වලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට තව දුරටත් ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.109,047,726 ක් හා උසාවි දඩ රු.9,382 ක් වේ. අදාළ අගයයන් පිළිබඳව පළාත් පාලන ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇත. එබැවින් පළාත් භාණ්ඩාගාරය විසින් දන්වන ලද ශේෂය ගිණුම්වලට ඇතුලත් කරන ලෙසට පළාත් පාලන ආයතන දැනුවත් කර ඇති බව. | ගිණුම් ශේෂ සැසඳීමට ලක් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.2.3 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.1,339,747,082 ක් ලෙස දක්වා තිබූ අතර එම ශේෂයට ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා මිය ගිය, වැඩ තහනමට ලක්කළ හා සේවය හැරගිය නිලධාරීන් 3,815 දෙනෙකුගෙන් තවදුරටත් අයවිය යුතු එකතුව රු.69,437,646 ක් වූ ණය ශේෂ ඇතුළත්ව තිබුණි. | වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ ණය ශේෂ සම්බන්ධ තොරතුරු හැර, අනිකුත් ආයතන වල ස්ථාන මාරු වී ගිය, මියගිය හා විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය අතහැර ගිය නිලධාරීන් 4,019 ක් අතරින් නිලධාරීන් 316 දෙනෙකුගෙන් රු.17,423,083 ක ණය නිරවුල් කර ඇති අතර ඉතිරි ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගනිමින් පවතින බව. | අදාළ ණය ශේෂයන් කඩිනමින් නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව දකුණු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 300 - ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන සහ "රාජ්‍ය වියදම් කළමනාකරණය" චක්‍රලේඛයේ 4.1 වගන්තිය | ආණ්ඩුකාරවරයට ලබාගත හැකි උපරිම මාසික ඉන්ධන ප්‍රමාණය/ දීමනාව පිළිබඳ සලකා බැලීමකින් තොරව චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස ආණ්ඩුකාරවර වෙනුවෙන් වෙන් කළ රථයේ අතිරේක ඉන්ධන වශයෙන් ලීටර් 4317.50 ක් වෙනුවෙන් රු.741,582 ක මුදලක් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් ගෙවීම් කර තිබුණි. උක්ත චක්‍රලේඛයේ ඡේද අංක 03ට අනුකූල නොවන ලෙස දකුණු පළාත් ආණ්ඩුකාරවර වෙත අමතරව ටොයොටා ජීප් රථයක්ද වෙන් කර දී තිබුණි. | උක්ත ජනාධිපති ලේකම් චක්‍රලේඛයෙහි සඳහන් පළාත් සභා ගරු ආණ්ඩුකාරවරුන් සඳහා ඉන්ධන දීමනා ගෙවීම සම්බන්ධ විධිවිධාන පිළිගනු ලබන බවත්, 2019 අප්‍රේල් 10 දිනෙන් පසු පළාත් සභාව විසුරුවා හැරීමත් සමඟ පළාත් ආණ්ඩුකාර වරුන්ගේ රාජකාරි වපසරිය පුළුල් වීම නිසා අතිරේක ඉන්ධන ලබා ගැනීමට සිදුවූ බවත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ රාජකාරී සඳහා වෙන්කර ඇති වාහන අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කරන අවස්ථාවන්හිදී සංචිත රථයක් ලෙස තවත් වාහනයක් ගරු ආණ්ඩුකාරතුමා වෙනුවෙන් වෙන්කර තිබූ බවත් චක්‍රලේඛ ප්‍රකාරව වෙන්කල හැකි වාහන 03 වෙනුවට වාහන 04 ක් නොවූ බව. | රාජ්‍ය වියදම් කළමනාකරණය හා ජාතික ප්‍රතිපත්ති පිළිබඳව අවධානයෙන් කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂය 301 - සභා ලේකම් කාර්යාලය

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2010 අගෝස්තු 09 දිනැති දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/57 වෙළුම 01 දරන ලිපිය | 2020 අගෝස්තු මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා කාලයට අදාළව දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට නිවසක් කුලියට ගැනීම වෙනුවෙන් රු.1,350,000 | 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව. | අනුකූල නොවන ලෙස ගෙවූ කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක දීමනාවක් උක්ත ලිපියට අනුකූල නොවන ලෙස ගෙවා තිබුණි. | | |
| (ආ) | ජනාධිපති ලේකම් චක්‍රලේඛ | | | |
| i. | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 1 වන වගන්තිය | පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව කාර්යාල දීමනා ගෙවිය නොහැකි වුවද දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට 2019 ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා කාර්යාල දීමනාව ලෙස රු.1,850,000 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කාර්යාල දීමනාව සම්බන්ධයෙන් කිසිදු සඳහනක් දක්වා නොමැති බවත් එම චක්‍රලේඛයෙහි ඇතුළත් නොවන වෙනත් දීමනා ගෙවීමෙන් වලකින ලෙසද සඳහනක් නොමැති බව සහ දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/7/1/2 දරන හා 2019 මැයි 31 දිනැති ලිපියෙන් ලද අනුමැතිය ප්‍රකාරව මෙම දීමනාව ලබාදී ඇති බවත්,<br>2022 වර්ෂයේ නිකුත් කරන ලද අංක පීඑස්/සීඑස්ඒ/11-18(1) දරන හා (11) චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව . | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තිය | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව ඩීසල් වාහනයක් සඳහා ඉන්ධන ලීටර් 500 ක් හිමිකම තිබියදී දකුණු පළාත් ආණ්ඩුකාරවරගේ 2019 ජූලි 09 දිනැති ලිපිය ප්‍රකාරව ඩීසල් වාහනයක් සඳහා ඉන්ධන ලීටර් 600 ක් ලබා ගැනීම නිසා 2019 ජූලි මස සිට 2022 සැප්තැම්බර් මස දක්වා ඩීසල් ලීටර් 3,900 ක් වෙනුවෙන් රු.708,000 ක් දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට ගෙවීම් කර තිබුණි. තවද, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස සුපිරි ඩීසල් රේටයන් පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා රු.682,525 ක වැඩිපුර මුදලක් ගෙවීම් කර තිබුණි. | ගරු සභාපතිතුමාගේ නිල රථ දෙක සඳහා එක් වාහනයකට ඩීසල් ලීටර් 600 බැගින් 2019 අප්‍රේල් මස සිට ඉන්ධන දීමනාව ලබාදීමට ආණ්ඩුකාර අනුමැතිය ලැබී ඇති බවත් රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛය අනුව ඉන්ධන දීමනා ගෙවීමේදී ලබාදිය යුතු ඉන්ධන වර්ගය කුමක්ද යන්න පිළිබඳ උපදෙස් ලබාදී නැති බවත් 2014/1 ජාතික අයවැය චක්‍රලේඛය අනුව එම උපදෙස් වලංගු වන්නේ 2014 - 2016 කාලය සඳහා පමණක් බවත්, එම කාලය සඳහා සුපර් ඩීසල් ලබාදී ඇති බව හා 2023/01 ප්‍රධාන ලේකම් චක්‍රලේඛය අනුව සභාපතිවරයාට ලබාදී ඇති වාහනයට හැර සභා ලේකම් කාර්යාලයේ සංචිත හා වෙන්කරන ලද වාහනවලට 2023 අප්‍රේල් 01 දින සිට සාමාන්‍ය ඩීසල්/පෙට්‍රල් රේටය | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පදනම් කරගෙන ඉන්ධන දීමනාව ගෙවනු ලබන බව. | |
| iii | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය | යොමුගත චක්‍රලේඛයට පටහැනිව දකුණු පළාත් සභාවේ සභාපතිවරයාගේ සම්බන්ධීකරණ හා මහජන සම්බන්ධතා ලේකම්වරුන්ට 2019 ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා මසකට රු.50,000 බැගින් රු.3,700,000 ක් වූ වාහන දීමනාවක් සහ නිල වාහන සපයා නොතිබියදී 2019 අගෝස්තු සිට 2022 ඔක්තෝබර් දක්වා රු.2,516,680 ක් වූ ඉන්ධන දීමනාවක්ද ගෙවා තිබුණි. | චක්‍රලේඛයේ 3.4 වගන්තිය ප්‍රකාරව උක්ත නිලධාරීන් එක් නිල වාහනයක් සඳහා හිමිකම් ලබන නමුත් ඔවුන් වෙත ලබාදීමට ඒ වන විට කාර්යාලය සතුව අමතරව වාහන නොතිබූ බැවින් වාහන දීමනාවක් ලබා දීමට කටයුතු කර ඇති බවත් 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව. | චක්‍රලේඛයට පටහැනිව කළ ගෙවීම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ශීර්ෂය 302 - දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තනතුරු 01 ක නිලධාරීන් 02 දෙනෙකුට 2019 මැයි මස සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.2,483,595 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අතරින් 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදයට අනුකූල නොවන ලෙස සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් සඳහා රු.254,780 ක මුදලක් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 මැයි 16 දිනැති අංක 02 – 2019 දරන චක්‍රලේඛය මත දකුණු පළාතේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව 2019 මැයි මස සිට ගෙවීම් කර ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටු නිර්දේශ ලබා ගෙන ඇති බව. | ජාතික ප්‍රතිපත්ති හා රාජ්‍ය වියදම් කළමනාකරණ පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. |

**1.5.4 ශීර්ෂය 303 - දකුණු පළාත් සමූපකාර සේවා කොමිෂන් සභාව**

**අවිධිමත් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලේ උපදේශක කාරක සභාවේ සභාපතිවරයාට, සාමාජිකයන් 06 දෙනෙකුට සහ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 12 දෙනෙකුට 2020 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා රු.3,045,421 ක් විශ්‍රාම වැටුප් අරමුදලෙන් දීමනා ලෙස ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත පමණක් ගෙවා තිබුණද, අරමුදලට අදාළ නියෝග මාලාව අනුව කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් හෝ අනෙකුත් ගෙවීම් පිළිබඳ නියෝග ලෙස කිසිවක් දක්වා නොතිබුණි. | දකුණු පළාත් සභාවේ 2019 අංක 02 දරණ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 07 වන වගන්තිය ප්‍රකාරව දකුණු පළාත් සභාවේ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව සමූපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් ගෙවනු ලැබිය හැකිය යන්න සඳහන් කර ඇත. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත එකී දීමනාව ගෙවීම් කර ඇති බව. | රාජ්‍ය වියදම් තළමනාකරණය පිළිබඳව හා ජාතික වැටුප් ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුය. |

**1.5.5 ශීර්ෂය 304 - දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ තනතුරු 04 ක නිලධාරීන් 08 දෙනෙකුට 2019 මැයි මස සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.6,679,200 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අතරින් 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදයට අනුකූල නොවන ලෙස | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 මැයි 16 දිනැති අංක 02 – 2019 දරන චක්‍රලේඛය මත දකුණු පළාතේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව 2019 මැයි මස සිට ගෙවීම් කර ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් ගෙන් සමන්විත | ජාතික ප්‍රතිපත්ති හා රාජ්‍ය වියදම් කළමනාකරණ පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. |

සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් කම්ටුවක් පත් කර එම කම්ටු සඳහා රු.910,415 ක මුදලක් නිර්දේශ ලබා ගෙන ඇති බව ගෙවා තිබුණි.

**1.5.5.1 දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට පාරිතෝෂිත වියදම් ඇස්තමේන්තුව ප්‍රකාරව පාරිතෝෂිත වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.63,306,577 ක් විය යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම ශේෂය රු.62,410,389 ක් ලෙස දැක්වීම නිසා රු.896,188 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් වර්ෂයේ පාරිතෝෂිත වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉතිරි කිරීමේ ගිණුමට ලැබුණු පොලී මුදල අඩු කර පාරිතෝෂිත වෙන් කිරීම සිදු කිරීම නිසා බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම් සිදුකළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයේ ලොග් ෂීට් මැෂින් (POS Machine) 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් වටිනාකම රු.1,282,455 ක් වූ චෙක්පතක් ලියා ආයතනයේ ගණකාධිකාරී භාරයේ රඳවා ගෙන තිබුණු අතර විගණිත දිනය වූ 2023 වර්ෂයේ මාර්තු මස 01 වන දින වන විටත් අදාළ මැෂින් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසානයේ එම මැෂින්වල වටිනාකම අධිකාරියේ දේපළ පිරියත උපකරණ යටතේ දක්වා තිබීම නිසා දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු.1,282,455 කින් වැඩියෙන් දක්වා තිබූ අතර ඊට අදාළ ක්ෂය වියදම රු.296,826 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ මුදල් ප්‍රතිපාදන මත මෙම මිලදී ගැනීම් සිදුකළ බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 අනුව වත්කම් සහ ඊට අදාළ ක්ෂය හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2021 දෙසැම්බර් 31 දිනට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සැපයුම්කාර ආයතනයකින් රු.3,018,300 ක් වටිනා ශබ්ද විකාශන යන්ත්‍ර 115 ක් මිලදී ගෙන තිබූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබූ නිසා දේපළ පිරියත හා උපකරණ වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව හා වත්කම් ලේඛනයේද යාවත්කාලින කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 අනුව වත්කම් සහ ඊට අදාළ ක්ෂය හඳුනාගත යුතුය. |
| (iv) | වටිනාකම රු.8,236,900 ක් වූ ආරක්ෂිත කැමරා 222 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබූ නිසා දේපළ පිරියත හා උපකරණ වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 අනුව වත්කම් සහ ඊට අදාළ ක්ෂය හඳුනාගත යුතුය. |
| (v) | ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කළයුතු රු.1,790,180 ක් වූ මුදල ජංගම ගිණුමක් තුල රඳවා ගෙන තිබූ අතර එම මුදල සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවියයුතු වියදමක් ලෙස දක්වා නොතිබුණි. | ජාතික ගමනා ගමන කොමිෂන් සභාවට ගෙවිය යුතු බැවින් එය ස්ථිරවම හඳුනා ගන්නා තෙක් උපචිත පදනමට ගත නොහැකි බැවින් එසේ උපචිත නොකර තිබේ. එහෙත් එය මේ වසරේදී ගැලපීමට ලක් වන බව. | සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් අදාළ වසර තුලදී ගිණුම්වලට හඳුනාගත යුතුය. |
| (vi) | 2022 වර්ෂයේ රු.229,000,000 ක් වූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැණුම් (REPO) වලදී රු.10,000,000 මාස 01 කින්ද රු.30,000,000 මාස 03 කින්ද රු.59,080,000 ක් මාස 12 කින්ද කල්පිරෙන ලෙස ස්ථාවර තැන්පතු වශයෙන්, ආයෝජනය කර තිබුණද, ඒ සඳහා පොදු ජර්නලය තුළ ගිණුම් විවෘත කර නොතිබුණි. එමෙන්ම භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැණුම් (REPO) හා ස්ථාවර තැන්පතුවල ආයෝජන යෙන් රු.6,008,800 ක පොලී ආදායමක් උපයා තිබුණද එය උපයාගත් ආකාරය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී REPO හෝ ස්ථාවර වත්කම් මගින් උපයා ගත් පොලිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ආයතනයේ සියලු ගණුදෙනු ලෙජර් ගිණුම් වල සටහන් කළ යුතුය. සියලු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

(ආ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ජාතික අයවැය චක්‍රලේඛ | | | |
| මුදල් අමාත්‍යාංශයේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන චක්‍රලේඛ 03(vii) ඡේදය | චක්‍රලේඛ ප්‍රකාරව සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදුකර තිබුණද, මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තැබිය යුතු වුවද ඊට පටහැනිව 2022 ජුනි 24, 27 හා 28 දිනයන්හිදි සේවකයින් 12 ක් බඳවා ගෙන 2022 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.2,896,161 වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | සිදු කරන ලද බඳවා ගැනීම් තුළින් චක්‍රලේඛයේ සඳහන් කරන ලද කොන්දේසි කඩකර ඇති මුත් එහි මුඛ්‍ය පරමාර්ථයට හානියක් නොවන අයුරින් එම චක්‍රලේඛයේ සඳහන් 05 වන කරුණ යථාර්ථයක් බවට පත් කිරීමට කටයුතු යොදා ඇති බව. | රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුගත වෙමින් චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

1.5.5.2 දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ආරක්ෂණ සංකල්පය අනුව ණයගැති ශේෂ සඳහා පොදු වෙන්කිරීමට අමතරව හඳුනාගත් ණයගැති ශේෂ සඳහා විශේෂ වෙන්කිරීමක් සිදුකළ යුතු වුවද සංවර්ධන අධිකාරියේ රු.2,970,000 ක වටිනා අක්‍රිය ණයගැති ශේෂ සඳහා විශේෂ ණය ප්‍රතිපාදන සිදුකර නොතිබුණි. | ණය නැවත අයකර ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීමෙන් පසුව එසේ නොහැකි නම් ඒ සඳහා වෙන් කිරීමක් ඉදිරියේදී සිදුකිරීමට නියමිත බව. | හඳුනාගත් අයකිරීම් කළ නොහැකි විශෙෂ ණයගැතියන් සඳහා විශේෂ වෙන්කිරීම් සිදුකළ යුතුය. |
| (ii) | දකුණු පළාත් ව්‍යවසායකත්ව දිවිබල සංවර්ධන ණය ව්‍යාපෘතිය යටතේ (Speed Loan) වක්‍රිය ණයගැතියන් සඳහා ආයතනයේ | ඉදිරියේදී සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයක් මගින් නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ පොළිය හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවත්වාගෙන යනු ලබන පරිගණක පද්ධතියේ ඇතුලත් ලැබිය යුතු ණය පොළිය රු.12,296,814 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | | |
| (iii) | දකුණු පළාත් ව්‍යවසායකත්ව දිවිබල සංවර්ධන ණය ව්‍යාපෘතිය යටතේ (Speed Loan) චක්‍රීය ණයගැතියන් සඳහා පොළිය ගනනය කිරිමේදී ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලයේදී ණය නොගෙවන ණයගැතියන් ගෙන් ණය ගෙවන තෙක් වර්ෂ 03 ට වැඩිවන කාලය සඳහා අදාලවන පොළිය වූ රු.3,756,742 ක පරිගණක පද්දතියක හෝ ගිණුම්ගත කිරීමක් සිදුකර නොතිබුණි. | අවු. 03 පසුවූ ණයගැතියන්ගේ ණය පොළිය හා ණයගැති ශේෂය ගිණුම්ගත කිරිම අයකර ගැනීමේ අවධානමක් පවතින බැවින් ගිණුම්ගත කර නොමැති බව. | නියමිත කාලයේදී ණය නොගෙවන (වර්ෂ 03ක කාලය අවසන් වූ) ණයගැතියන්ගෙන් පොළි අය කර ගිණුම්ගත කළ යුතුය. |
| (iv) | දකුණු පළාත් ව්‍යවසායකත්ව දිවිබල සංවර්ධන ණය ව්‍යාපෘතිය යටතේ (Speed Loan) චක්‍රීය ණයගැතියන් සඳහා අධිකාරිය විසින් පවත්වාගෙන යන ණය පාලන පද්ධතියට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට ශේෂය රු.47,668,376 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු.38,360,005 ක් වූයෙන් රු.9,308,371 ක් වෙනසක් පැවතුණි. | වෙනස පවතින්නේ ආරම්භක ශේෂයේ බැවින් එය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් පද්ධතියට අනුව ශේෂය සහ පරිගණක පද්ධතිය අනුව පවත්නා ශේෂ කාලීනව නිවැරදි වන බවට තහවුරු කර ගත යුතු අතර සැසඳුම් ප්‍රකාශ සකස් කළ යුතුය. |
| (v) | සමාලෝචිත වර්ෂයේ 2022 ජූනි 20 දින වර්ෂයක කාලයක් සඳහා ආරම්භ කර තිබුණු රු.40,000,000 ක ස්ථාවර තැන්පතු සඳහා, ලැබියයුතු පොළියෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු.4,313,425 ක පොළිය හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයක් මගින් නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කාලඡේදය ට අදාල අදායම් හඳුනාගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂයේ අළුතින් ආරම්භ කරන ලද රු.35,000,000 ක ස්ථාවර තැන්පත් සඳහා වැයකර තිබූ මුදල, මුදල් ප්‍රවාහයේ මුදල් ගලා යාමක් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරිමේදි වරද නිවැරදි කිරිමට කටයුතු කරන බව දක්වා ඇති බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ සිදුවූ සියළු මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගත යුතුය. |
| **(ආ)** | **අවිධිමත් ගණුදෙනු** | | |
| (i) | උපමාන පාදක සංවර්ධන සැලැස්ම යටතේ, 2018 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ රු.700,000 ක් සහ 2019 වර්ෂයේ දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රු.1,767,718 ක් ලෙස එකතුව රු.2,467,718 ක් යොදවා ලබුදූව ගොවිපල තුල ඉදිකර තිබූ ජීව වායු ඒකකය 2019 ජුනි 12 දින වැඩ අවසන් කර භාරදී තිබුණද, 2019 ජුනි මස සිටම මෙම ජීව වායු ඒකකයේ ක්‍රියාකාරීත්වයේ ගැටළු පිළිබඳව ගොවිපල කළමනාකරු විසින් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාපෘති) දැනුවත් කර තිබුණද 2022 දෙසැම්බර් මස දක්වාම ක්‍රියාකාරීත්වය යථා තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට මෙම ඒකකය ක්‍රියාත්මක තත්වයේ නොමැති බැව් පිලිගන්නා බවත් , 2019 ජුනි මස සිට වසරක පමණ කාලයක් මෙම ඒකකය ක්‍රියාත්මක වූ බවත්, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ඉල්ලීම අනුව ඉංජිනේරු පර්යේෂණ ආයතනය විසින් එහි ඇති ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අනතුරුව භෞතික පරීක්ෂාවක් සිදුකළ යුතු බවත්, නර්ඩ් ආයතනය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව පිරිසිදු කර වාර්තාවක් ලබාදිය හැකි බවත්, ඒ අනුව තෝරාගන්නා ලද ආයතනය විසින් දිරා ගිය මල අපද්‍රව්‍ය ඉවත් කිරීමට රු.392,000 ක මුදලකට ගිවිසුම් ගතවීමට කටයුතු කර ඇති බව. | ආරම්භ කරන ලද ව්‍යාපෘති මනාව පාලනය කර පවත්වා ගත යුතු අතර අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් ව්‍යවසායකත්ව දිවිබල සංවර්ධන ණය ව්‍යාපෘතිය යටතේ 2022 ඔක්තෝබර් 31 දිනට මුදල් පොත අනුව ලැබීම් සහ පරිගණක වැඩසටහන අනුව රු.2,347,414 ක වෙනසක් පැවතුණි. කුවිතාන්සි 13 ක අනුක්‍රමික අංක පිළිවෙල වංචනික ලෙස වෙනස් කරමින් ණය ලැබීම්වල එකතුව රු.149,000 ක මුදල් අවභාවිතා කිරීමට අදාළව ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ පළමු උපලේඛනය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විෂය නිලධාරීනියට අදාළව මූලික විමර්ශනයන් සිදුකර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලබා දෙන බව. | මුදල් පොත හා පරිගණක වැඩසටහන අනුව ලැබීම් සසදා වෙනස හඳුනා ගත යුතු අතර මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | M-CASH මඟින් අය වූ ණය මුදල් මුදල්, පොතෙහි සටහන් කිරීමේදී මාස 05 සිට 11 දක්වා කාල ප්‍රමාදයන් මෙන්ම කුවිතාන්සි නිකුත් කිරීමේදී ණය අංකය, නම සටහන් නොවූ අවස්ථාද පැවතුණි. | අදාල මාසයෙහි M-CASH වටිනාකම බැංකු ප්‍රකාශය ලැබීමෙන් පසු ඊලඟ මාසයේදී මුදල් පොතේ සටහන් කිරිමට ලබා දෙන බවත්, කාර්යාලයේ වහල අළුත්වැඩියාව හේතුවෙන් වෙනත් කාර්යාලයක සිටි බැවින්, අතපසු වීමක් සිදු වි ඇති බවත්, M-CASH සේවාව සඳහා P.I.V ප්‍රමාදයකින් තොරව ගිණුම් අංශය වෙත භාර දිය යුතු බවට විෂය නිළධාරි දැනුවත් කර ඇති බව. | උපයෝගී ලේඛන සහ පත්‍රිකා පවත්වා ගෙන යාම හා නඩත්තුව පිළිබඳව මනා පාලනයක් හා අධීක්ෂණයක් තිබිය යුතුය. |

**(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | | |
|---|---|---|
| දකුණු පළාත් සංවර්ධන අධිකාරිය සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන එම ආයතනවල අරමුණු හා කාර්යයන් ඉටුකිරිම සඳහා යෙදවිය යුතු වුවත්, රු. 44,250,000 ක් වූ අරමුදල් එකී අරමුණු සඳහා යෙදවීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | අධිකාරියේ ස්ථාවර තැන්පතු තුළ මාතර දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ වත්කම් දකුණු පළාත් සංවර්ධන අධිකාරියට පැවරීමේදී ලද මුදල, ණය ව්‍යාපෘතියක ඇප සුරැකුම් මුදලක් සහ තාවකාලිකව නවතා තිබෙන දසුණ ණය යෝජනා ක්‍රමයේ මුදල් ඇතුළත්ව ඇති බව. | අදාළ මුදල් ආයතන අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය. |

**1.5.5.3 රුහුණු සංචාරක කාර්යාංශය**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 වර්ෂයේ ආරම්භක ජර්නල් සටහන සහ ප්‍රධාන ලෙජරය අනුව ගිණුම් විෂයයන් 05 ක රු.38,779,461 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රධාන ලෙජරය නැවත නිවැරදිව සටහන් කරනු ලබන බව. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාළව සටහන් කරන ලද එකුතුව රු.24,650,273 ක් වූ ජර්නල් සටහන් 23 ක් (ආරම්භක ශේෂවලට අදාළ ජර්නල් සටහන් හැර) නිවැරදිව ප්‍රධාන ලෙජරයට ගලපා නොතිබුණි. | ප්‍රධාන ලෙජරය කඩිනමින් යළි සකස් කර නිවැරදි කරන බව. | ප්‍රධාන ලෙජරය නිවැරදි කළ යුතුය. |

**(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | | |
|---|---|---|
| රුහුණු සංචාරක කාර්යාංශය සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන එම ආයතනවල අරමුණු හා කාර්යයන් ඉටුකිරිම සඳහා යෙදවිය යුතු වුවත්, රු.19,144,036 ක් වූ අරමුදල් එකී අරමුණු සඳහා යෙදවීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ආයතන ස්ථාපිත කිරීමට පදනම් කර ගෙන ඇති ප්‍රඥප්තීන් විසින් ස්ථාවර තැන්පතු ගිණුම්වල මුදල් ආයොජනය කිරීම සීමා කිරීමක් සිදු කර නොමැත. රුහුණු සංචාරක කාර්යාංශයෙහි ස්ථාවර තැන්පතු තුළ ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති තුළින් උපයන ලද ආදායම ඇතුළත් බව. | අදාළ මුදල් ආයතන අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය. |

**(ඇ) නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| | | |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වන විට රු.1,391,298 ක වටිනාකමක් වූ රුහුණු සංචාරක කාර්යාංශයට අයත් අම්බලන්ගොඩ තොරතුරු මධ්‍යස්ථානය 2018 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි. | අධ්‍යක්ෂක මණ්ඩලය සමඟ සාකච්ඡා කර කඩිනමින් මේ සඳහා ක්‍රියා කිරීමට කටයුතු කරනු ලබන බව . | මෙම ඉඩම කාර්යාංශයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.6 ශීර්ෂය 305 - දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සෞඛ්‍ය කාර්යය සහායක ලෙස සේවය කළ අයකු මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීමේ චෝදනාවට 2020 ඔක්තෝබර් 21 දින සිට වැඩ තහනමකට ලක්කර තිබූ අතර 2021 ජූලි 02 දිනැති නඩු තීන්දුව මත වරදකරු වී තිබුණද, විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි. 2021 ජුනි සිට 2022 නොවැම්බර් දක්වා අඩ වැටුප් ගෙවා තිබූ අතර ලබාගත් ආපදා ණය, දේපල ණය සහ පාපැදි ණයෙහි එකතුව ලෙස රු.306,536 ක ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවතුණි. | අමාත්‍යාංශය විසින් පරීක්ෂණ නිමවා වාර්තා නොකිරීම මත මෙම තත්ත්වය ඇති වූ බව. | කඩිනමින් විනය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 2021 වර්ෂයේ ග්‍රාමීය සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ කඹුරුපිටිය හා තංගල්ල රෝහල් සඳහා සපයා සවිකර ක්‍රියාත්මක කිරීමේ පදනමට (Supply Installation And Commission) රු.13,681,000 කට මිලදී ගෙන තිබූ යන්ත්‍ර 04 ක් 2022 දෙසැම්බර් ලැබීමෙන් අනතුරුව තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබූ මුදල් මුදාහැර ගෙවීම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද යන්ත්‍ර සඳහා රුඳවුම් උපකරණ හා උපාංග නොමැති වීමෙන් ක්‍රියාත්මක නොකර නිෂ්කාර්යව පැවතුණි. | 2021 වර්ෂය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින්ම උපකරණ ලබාගැනීම වඩාත් වාසිදායක බැවින් පොදු තැන්පත්හි රඳවා 2022 සැපයුම ලද පසු මුදල් නිදහස් කරන ලද බව. | අවශ්‍යතා හඳුනා ගැනීම, ප්‍රසම්පාදනය කිරීම හා මිලදී ගැනීමේ කොන්දේසි ඉටු කරවා ගෙන ගෙවීම් කළ යුතුය. |

**(ආ) වාහන උපයෝජනය**

| | | |
|---|---|---|
| ඇල්පිටිය මූලික රෝහලෙහි ගිලන් රථය සඳහා 2022 අප්‍රේල් 11 දින රු.363,192 ක ඇස්තමේන්තුව අනුව, පෞද්ගලික ආයතනයක් වෙත අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කර ඒ සඳහා 2022 මැයි 19 දින රු.362,753 ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණද, නැවත රථයේ ඇති වූ දෝෂයක් හේතුවෙන් රු.651,019 ක ඇස්තමේන්තුවක් මත අළුත්වැඩියාව සඳහා 2022 මැයි 25 දින රථය අදාළ ආයතනයටම භාරදී තිබුණි. එහෙත් එම අලුත්වැඩියාවෙන් පසුද රථයේ දෝෂ නිරාකරණය නොවූ බැවින් 2022 නොවැම්බර් 28 දින නැවතත් රු.1,679,877 ක ඇස්තමේන්තුවක් මත භාරදී තිබුණි. යාන්ත්‍රික ඉංජිනේරු ඒකකයේ නිර්දේශයන් වරින් වර වෙනස් වීම හා විධිමත් ලෙස නොලැබීම මත 2023 පෙබරවාරි 23 දින වන විටද ගිලන්රථය අළුත්වැඩියාවෙන් තොරව අදාළ ආයතනයේ පැවතුණි. | විගණන නිරීක්ෂණ පිළිගනු ලබන බවත් එම අළුත්වැඩියා දෙකෙන් පසු නැවතත් ඇතිවූ දෝෂයක් හේතුවෙන් තෙවන අළුත්වැඩියාවක් සඳහා ඉදිරිපත්කර ඇත. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් නිර්දේශ ලබාදිය නොහැකි බව ඇල්පිටිය රෝහල් වෛද්‍ය අධිකාරී වෙත දන්වා ඇති බැවින් ඇල්පිටිය රෝහල් සංවර්ධන කළමනාකරණ කමිටුවේදී ගත් තීරණයක් මත තාක්ෂණ නිලධාරී කමිටුවක් මගින් මේ සඳහා නිර්දේශයක් ලබා ගැනීමට කටයුතුකර ඇති බව. | කඩිනමින් අලුත්වැඩියා කර ඵලදායී ලෙස භාවිතයට ගත යුතු අතර මෙයට හේතු වූ කරුණු සොයා බැලීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) හඳුනා ගන්නා ලද පාඩු**

| | | |
|---|---|---|
| දකුණු පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව අලාභ හානිය වූ දිනයේ සිට තුන්මසක් ඇතුලතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් පළාත් සභාව තුළ රු.8,409,183 ක් වූ වාහන | අනතුරු හා පාඩු සම්බන්ධයෙන් අදාළ කටයුතු කඩිනමින් අවසන් කර විගණනය වෙත වාර්තා කරන බව. | මූල්‍ය රීති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

අනතුරු සිද්ධි 15 ක් සම්බන්ධයෙන් දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් එලෙස කටයුතු කර නොතිබුණි. එමෙන්ම, තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු යටතේ වටිනාකම රු.20,573,125 ක් වූ සිද්ධීන් 40 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | | |
|---|---|---|
| ගෝනපිනුවල, ඇල්පිටිය, අක්මීමන, හබරාදූව සහ බෝපේ පෝද්දල යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල පිහිටි ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ඇතැම් ඉඩම්වල අනවසර පදිංචිකරුවන් අත්පත් කරගෙන භුක්ති විඳීම් සිදු කරන බවද නිරීක්ෂණය විය. | නිරීක්ෂණ පිළිගෙන ඇත. ඉඩම් නිරවුල් කිරීම සම්බන්ධව ක්‍රියාකරමින් පවතින බව. | අනවසරකරුවන් ඉවත් කිරීමට කඩිනම් පියවර ගැනීම මෙන්ම ඉඩම්වල අයිතිය අත්පත් කර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

### 1.5.7 ශීර්ෂය 306 - දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව

**(අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| i. | 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ තනතුරු 01 ක නිලධාරීන් 02 දෙනෙකුට 2019 මැයි මස සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.1,757,590 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අතරින් 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදයට අනුකූල නොවන ලෙස සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් සඳහා රු.222,960 ක මුදලක් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 මැයි 16 දිනැති අංක 02–2019 දරන චක්‍රලේඛය මත දකුණු පළාතේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව 2019 මැයි මස සිට ගෙවීම් කර ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ජ්‍යොෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටු නිර්දේශ ලබා ගෙන ඇති බව. | ජාතික ප්‍රතිපත්ති හා රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සහ 2007 මැයි 18 දිනැති SP/CSA/07/07 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය | ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි පළාත් පාලන ආයතන 49 ක් සඳහා තේරී පත් වූ සභිකයින් 1,131 දෙනෙකුගෙන් 2018 වර්ෂයේ සිට 2022 දක්වා පිළිවෙලින් සභිකයින් 536 ක්, 652 ක්, 739 ක්, 689 ක් හා 771 දෙනෙකු වාර්ෂිකව තම වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ සභිකයින් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුත්තේ කවුරුන් විසින්ද යන්න පිළිබඳව පළාත් පාලන කොමසාරිස්ගේ 2023 මැයි 09 දිනැති ලිපිය මඟින් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙතින් උපදෙස් ඉල්ලා ඇති බැවින් ඒ සම්බන්ධව පසුව අදාළ තීරණ පරිදි ක්‍රියා කොට වාර්තා කරන බව. | යොමුගත රෙගුලාසි අනුව අදාළ වත්කම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| iii. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8), (9) වගන්ති | අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපති වරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත අධිභාරලාභියා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාළ මුදල ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා නොමැති නම් හා අභියාචනාවක් කර නොමැති නම් අදාළ තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලුම් කර අදාළ මුදල් අයකර ගැනිමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කළ යුතු වුවත්, විගණකාධිපති විසින් විවිධ අවස්ථාවන්හිදී නිකුත් කළ වටිනාකම රු.9,195,274 ක් වූ අධිභාර සහතික 11 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී නියමයන් අනුව කටයුතු කර නොතිබුණි. | • ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයේ පිළිවෙලින් අධිභාර 02 ක් සහ 05 සඳහා අභියාචනා පරීක්ෂණ වාර්තා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇතත් තීරණ දැනුම් දී නොමැති බවත්,<br>• මාතර දිස්ත්‍රික්කයේ අධිභාර 01කට අදාලව අධිභාර කරුවන් 02ක් සඳහා නඩු පවරා ඇති අතර, ඉන් එක් අධිභාරකරුවෙක් සඳහා මසකට රු.50,000 බැගින් අවුරුද්දක් ඇතුලත ගෙවීම් කළ යුතු බවට ගරු අධිකරණය විසින් 2023 මැයි 03 දින නියෝග කර ඇත. අනෙක් අධිභාරකරු සඳහා 2023 ජූලි 05 දින නැවත මාතර මහේස්ත්‍රාත් අධිකරණයේදී නඩුව කැඳවීමට නියමිතව ඇති බවද, එමෙන්ම මාතර දිස්ත්‍රික්කයට අදාල අධිභාර 03 ක් සඳහා අදාළ ආකෘති ප්‍රකාරව පරීක්ෂණ වාර්තා ලබා දෙන ලෙස මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත දන්වා ඇති බව. | අධිභාර මුදල් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දකුණු පළාතේ පළාත් පාලන ආයතන 49 න් 19 ක විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොවීමෙන් "සෑම පළාත් පාලන ආයතනයකම විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීම" යන අරමුණ ඉටුකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන ආයතන 49 න් 19 ක විධිමත් කසළ කලාමනාකරණය නොවීමට හේතු ලෙස පළාත් පාලන ආයතන වල ඉඩකඩ ප්‍රමාණවත් නොමැතිවීම, ස්ථිර භූමියක් නොමැති වීම, ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොමැති වීම, යන්ත්‍ර සූත්‍ර වල හිඟ වීම, පුහුණු සේවක ශ්‍රමය හිග වීම හා මහජන විරෝධතා ආදී ගැටලු ද මේ සඳහා බලපා ඇති බව. | පරිසර ආරක්ෂණ වැඩපිළිවෙලක් බැවින් විකල්ප ක්‍රියාමාර්ග මඟින් සෑම පළාත් පාලන ආයතනයකම කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.8 ශීර්ෂය 307- දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ඉකුත් වර්ෂය තුළ රු.18,560,789 ක් වැය කර නවීකරණය කර තිබූ ආයුර්වේද රෝහල් 03 කොවිඩ් වාට්ටුවල වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේ වරල්ල, අපරැක්ක සහ බෙලිඅත්ත ආයුර්වේද රෝහල් සඳහා ලැබී තිබූ විදුලි ජනක යන්ත්‍ර 03 ක් සහ උපාංගවල වටිනාකම වූ එකතුව රු.7,763,700 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්තමානය වන විට ගිණුම්ගත කර ඇති බව. | සියලු වත්කම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

(ආ) **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙණු**

**සීමා නොපිළිපැදීම්**

**වාණිජ අත්තිකාරම් ගිණුම්**

| | | |
|---|---|---|
| දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදන අත්තිකාරම් ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂයේදී අනුමැතිය ලබාදී තිබූ ලැබීම්වල අවම සීමාවට රු.1,779,469 කින් ළඟාවී නොතිබුණු අතර හර ශේෂයේ උපරිම | දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ඖෂධ නිශ්පාදනාගාරය වෙත ගෙවිය යුතු මුදල රු.18,061,611 ක මුදල ගෙවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන | සීමා සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සීමාව රු.2,701,613 කින් ඉක්මවා තිබුණි. | තිබුණේ නම් නියත වශයෙන්ම සංශෝධිත ලැබීම් සීමාව සහ හර ශේෂ සීමාව වෙත ලඟා වීමට හැකියාව තිබූ බව. | |

**(ඈ) බැරකම් හා බැඳීම්**

| | | |
|---|---|---|
| බෙලිඅත්ත නිෂ්පාදනාගාරයේ වාණිජ අත්තිකාරම් ගිණුමට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුව නමින් රු.18,061,611 ක ණයගැති ශේෂයක් පැවතියද එම වටිනාකම ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව සිදු කළ යුතුය. |

## 1.5.9 ශීර්ෂය 308 - දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

**(අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 2022 නොවැම්බර් 25 දිනැති අංක 08/2022 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ජාතික අයවැය චක්‍රලේඛය | යොමුගත චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.4,864,268 ක් වැයකර 2020 අ.පො.ස (සා.පෙළ) සෞන්දර්ය විභාග ප්‍රතිඵල ඇගයීමේ වැඩසටහන 2022 නොවැම්බර් 29 දින පවත්වා තිබූ අතර වියදම තුළ ඇගයීම් වැඩසටහනේ තිළිණපත් වෙනුවෙන් රු.2,574,200 ක් පමණක් වැය කර තිබුණි. | සමස්ථ වැඩ සටහන සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලද අනුමැතිය මත 2022 නොවැම්බර් 29 දින මෙම වැඩ සටහන පැවැත්වූ බවත්, එහිදී ගුරු භවතුන් හා අධ්‍යාපන නිලධාරීන් සියල්ල 1500 කට ආසන්න ප්‍රමාණයක් සඳහා තිළිණපත් ලබාදීම ඇතුළුව මුළු වියදම රු.4,864,268 ක් බවත් ඒ අතුරින් ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් හා විදුහල්පති වරුන්ට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් රුහුණු රන්සළු තිළිණපතක් ත්‍යාගයක් වශයෙන් ලබාදෙන ලද බවත්,ඒ සඳහා වූ වියදම රු.2,574,200 ක් බව. | වියදම් පාලන චක්‍රලේඛ වලට පටහැනිව කටයුතු නොකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ තනතුරු 04 ක නිලධාරීන් 05 දෙනෙකුට 2022 ජනවාරි මස සිට දෙසැම්බර් 31 දින දක්වා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදයට අනුකූල නොවන ලෙස සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් සඳහා රු.361,905 ක මුදලක් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 මැයි 16 දිනැති අංක 02–2019 දරන චක්‍රලේඛය මත දකුණු පළාතේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව 2019 මැයි මස සිට ගෙවීම් කර ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටු නිර්දේශ ලබා ගෙන ඇති බව. | ජාතික ප්‍රතිපත්ති හා රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. |

**1.5.9.1 දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුව විශ්‍රාම පාරිතෝෂිත ප්‍රතිලාභ ගෙවීම (Gratuity) සඳහා අරමුදලක් සහ ඊට අනුරූපී ආයොජනයක් ආරම්භකර පවත්වා ගොස් නොතිබුණි. | අරමුදලක් සහ ඊට අනුරූපී ආයෝජනයක් දැනටමත් පවත්වා ගෙන යයි. ඒ සඳහා මාස් පතා 1,000,000 බැගින් මුදල් ලැබෙන අතර එම මුදල වෙනම පවත්වා ගෙන යන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව අසම්භාව්‍ය බැරකම් Contingency Liability පිළිබඳ තොරතුරු ගිණුම් සටහන් මගින් හෙළිදරවු කළ යුතු වුවත්, අධිකාරියට එරෙහිව, විවිධ පාර්ශවයන් විසින්, පවරා තිබුණු නඩු 25 ක් පැවතියද, එවා පිළිබඳව ගිණුම් සටහන් මඟින් හෙළිදරවු කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම නඩු තුළ අධිකාරීයේ සේවය කළ නිලධාරීයකු විසින් වන්දි වශයෙන් රුපියල් මිලියන 10 ක් ඉල්ලා පැවරු නඩුවක්ද විය. | ඉදිරි වසරේදි ඇතුලත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත් ගෙවීම් සිදු කිරීමේදී එම කොන්ත්‍රාත් වටිනාකමින් රඳවාගත් රු.2,587,365 ක් වූ මුදල හරස් සටහන් මඟින් ගිණුම්ගත කිරීමකින් තොරව වෙනම ජංගම ගිණුමක් තුළ රඳවා ගෙන තිබුණි. | මෙම නිරික්ෂණය හා එකග විය නොහැකි වන බව. | ගිණුම් සටහන් තැබීමේදී ඒකාකාරී ලෙස ගිණුම් සටහන් තැබීම සිදුකළ යුතුයි. |
| (iv) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී “ලැබිය යුතු පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන” ගිණුමේ ආරම්භක ශේෂය වශයෙන් රු.179,890,190 ක ශේෂයක් පැවති අතර, ඉකුත් වර්ෂයේ ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති 103 ක් සඳහා රු.184,790,566 ක ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂයේදී වැඩිපුර ප්‍රතිපාදනය කර තිබුණු රු.176,515,399 ක මුදල, මෙම ගිණුමට එරෙහිව කපා හැරීමෙන් පසු ගිණුමේ ඉතිරිවූ රු.3,374,791 ක ශේෂය “මාර්ග ගිණුමේ ඌණතාවය” නැමැති ගිණුමට කිසිදු අනුමැතියකින් තොරව මාරු කර තිබුණද ප්‍රවර්ථන වර්ෂයේ ගිණුම් සටහන් මඟින්ද හෙළිදරවු කර නොතිබුණි. | අවිච්ඡේද හා අතැති බිල්පත් වල වටිනාකම රු. 184,790,566 ක් උපචිත කළද රටේ පවතින දැඩි මූල්‍ය අර්බුදකාරී තත්වය මත සියයට 36 ක් අහුරා තැබීමට ලැබුණ උපදෙස් අනුව මෙම උපචිත මුදල තවදුරටත් ගෙවීමට නොහැකි බැවින් ඉවත් කිරීම සඳහා ජර්නල් සටහනක් මගින් කළ බව . | උපචිත වියදම් හඳුනාගැනීමේදී එය සැබවින්ම වගකීමක් වන්නේද යන්න තහවුරු කරගැනීමකින් තොරව ඒවා ඇති නොකළ යුතුයි. එසේම අදාළ ගිණුම්වලට අදාල ලෙජර් ගිණුම් නඩත්තු කළයුතුයි. |
| (v) | එකතුව රු.89,038,112 ක්වූ ණයගැති ශේෂ සහ එකතුව රු.293,617,610 ක් වූ ණයහිමි ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන අතර, ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන බව. | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් වල පවත්නා ශේෂ නිරවුල් කරගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (vi) | ගිණුම් සටහන් අංක 09 යටතේ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු රු.99,903,208 ක ශේෂයක් පැවතුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය 2022 වර්ෂයේ මූල්‍ය | අධිකාරිය විසින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතර වෙත මෙම ලැබිය යුතු මුදල් අදාල වර්ෂවල දැනුවත්කර ඇති බවත් ඒ පිළිබඳ. ගෙවිය යුතු ගිණුමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඇතිකර | දීර්ග කාලයක් පවත්නා ලැබිය යුතු ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශන තුළ එවැනි ශේෂයක් දක්වා නොතිබුණි. | ගතයුතුව ඇති බව. | |

**(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | | | |
|---|---|---|---|
| (i) | 2022 පෙබරවාරි 01 වන දින දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ සාකච්ඡාවෙදී තීරණය කර තිබූ පරිදි, ප්‍රතිචක්‍රීකරණය නොකරන ප්ලාස්ටික්, ඇස්පෝල්ට් කොන්ක්‍රීට් පාරවල් සඳහා යොදා ගැනීමේ දකුණු පළාත් නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා හම්බන්තොට - සිතුල්පව්ව විහාරස්ථාන මාර්ගයෙහි කි.මී.2 ක් සංවර්ධනය කිරීමටත් යෝජනා වී තිබුණු අතර, ඒ අනුව අදාළ කර්මාන්තය 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. පසුව මේ සම්බන්ධයෙන් ඇස්තමේන්තු පිළියෙල කරන ලෙස දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී හා හම්බන්තොට දිස්ත්‍රික් ඉංජිනේරු වෙත පවරා තිබුණ ද, මෙම වාර්තාවේ දින දක්වාම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රතිචක්‍රීකරණය නොකරන ප්ලාස්ටික්, ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් පාරවල් සඳහා යොදා ගැනීමේ දකුණු පළාත් නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රතිචක්‍රීකරණය නොකරන ප්ලාස්ටික්, ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් පාරවල් සඳහා යොදා ගැනීමේ දකුණු පළාත් නියමු ව්‍යාපෘතිය සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තිස්ස ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලයට අයත් සිතුල්පව්ව මාර්ගයේ කි.මී.2ක් යොදා ගැනීමට ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2022 පෙබරවාරි 01 දින පැවති රැස්වීමේදි යෝජනා වූ බවත් එම රැස්වීමේදි ඊට අදාල ඇස්තමේන්තුව AGC Innovate පුද්ගලික ආයතනයට ලබාදෙන ලෙස දැනුම්දෙන ලද බවත් ඒ අනුව ඉදිරි පියවර ගනු ලබන බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව එහි ඇතුළත් කරුණු ක්‍රියාත්මක කිරීමට කළමණාකාරීත්වය කටයුතු කළ යුතුය. |
| (ii) | මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන අළුත්වැඩියාව සඳහා වෙනම ඒකකයක් පිහිටුවා තිබියදී, සමාලෝචිත වර්ෂය තුල, අධිකාරිය සතු වාහන භාහිර ආයතන වෙතින් අළුත්වැඩියා කිරීම සඳහා රු.7,400,200 ක් වැය කර තිබුණි. | ඒකකය සතු සීමිත මානව සම්පත මේ සඳහා යොදාගනු ලබන අතර පූර්ණ අළුත්වැඩියා සිදුකළ යුතු වාහන යාන්ත්‍රික ඉංජිනේරුවර යාගේ නිර්දේශ පරිදි විධිමත් ටෙන්ඩර් පරිපාටියට අනුකූලව බාහිර ආයතන මගින් සිදුකිරීම කරනු ලබන බව. | වාහන අළුත්වැඩියාව සඳහා පිහිටුවා ඇති ඒකකයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම තුළින් බාහිර ආයතන වෙතින් සිදුකරනු ලබන නඩත්තු අවම කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | උපචිත වියදම් ගිණුම්ගත කිරීමේදී ඊළඟ ගිණුම් වර්ෂය තුළ පියවිය යුතු අතැති බිල්පත් හා අදාළ කාර්යයන් සම්පූර්ණ වීමෙන් පසු සිදු වූ ගණුදෙනු උපචිත වියදම් | අවිච්ඡේද හා අතැති බිල්පත් වල වටිනාකම රු. 184,790,566 ක් උපචිත කිරීමට හේතු වූයේ අනුමත වූ මෙම කර්මාන්ත ඉටුකිරීම සිදුකළ යුතු බැවින් රටේ පවතින දැඩි මූලා | උපචිත වියදම් හඳුනා ගැනීමේදී ඒවා සැබෑ ලෙසම වගකීමක් වන්නේද යන්න ගිණුම් ප්‍රමිත අනුව තහවුරු කර ගැනීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, සත්‍ය වශයෙන්ම උපචිත වියදමක් බවට පත් නොවූ හා ඉදිරියේදී ඉටුකිරීමට අපේක්ෂිත රු.184,790,566 ක ප්‍රතිපාදන උපචිත වියදම් ලෙස දක්වා තිබීමෙන් 2021 වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. එමෙන්ම එය ගිණුම්කරණ මූලධර්මයට පටහැනිව 2022 වර්ෂයේදී කපා හැර තිබුණි. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ලැබිය යුතු පළාත් නිශ්චිත නමින් සත්‍ය වශයෙන්ම අදාළ වර්ෂයේ කරන ලද කාර්යයන් වෙනුවෙන් ලැබිය යුතු බිල්පත් නොමැතිව ගිණුමක් පවත්වා ගෙන ගොස් තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ අධිකාරියේ ව්‍යාපෘති වලට අදාළ තථ්‍ය උපචිත වියදම රු.8,275,167 ක් විය. | අර්බුදකාරී තත්වය මත සියයට 36 ක් අහුරා තැබීමට කටයුතු කළ යුතු බැවින් උපචිත කරන ලද වැඩ වලින් අහුරා තැබීමට උපදෙස් දුන් අවිච්ඡේද කර්මාන්ත වල වැඩ කටයුතු නතර කිරීමට කටයුතු කරන ලද බව. | යුතුය. |
| (iv) | මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන එම ආයතනවල අරමුණු හා කාර්යයන් ඉටුකිරිම සඳහා යෙදවිය යුතු වුවත්, රු.430,832,721 ක් වූ අරමුදල් එකී අරමුණු සඳහා යෙදවීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථාවර තැන්පතු තුළ රඳවා ගැනීමේ ගිණුමේ ශේෂය, පොදු තැන්පත් ගිණුමේ ශේෂය, පාරිතෝෂික ගිණුමේ ශේෂය, අධිකාරියේ ණය ගිණුමේ ශේෂය සහ ස්ථාවර තැන්පතු පොළී ආදායම් නැවත නැවත ආයෝජනය තුළින් ගොඩනැගී ඇති අරමුදල් වලින් ස්ථාවර තැන්පතු ශේෂයට ඇතුළත් බව. | අදාළ මුදල් ආයතන අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය. |

**(ඇ) අවිධිමත් ගණුදෙනු**

| | | |
|---|---|---|
| ඇස්පෝල්ට් අංගනය භාරව කටයුතු කළ යාන්ත්‍රික ඉංජිනේරුවරයා හා මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ගණකාධිකාරීවරයා විසින් ගලගොඩ ඇස්පෝල්ට් අංගනයේ මෙහෙයුම් වලට අදාළව අමුද්‍රව්‍ය තොග පාලන පද්ධති හෝ පිරිවැය ගිණුම්කරණ ක්‍රමවේද හඳුන්වාදී නොතිබුණි. එමනිසා නිෂ්පාදන ප්‍රමාණයේ අවශ්‍යතාවය අභිබවා ගල් මිලදී ගැනීමෙන් | අඛණ්ඩව නිෂ්පාදන කටයුතු සිදුකරගෙන යැමේදි අමුද්‍රව්‍ය මිලදි ගැනීම සිදුකළ යුතුය . දිනකට අවම වශයෙන් ඇස්පෝල්ට් ටොන් 200 ක් පමණ නිෂ්පාදනය කරන යන්ත්‍රයකට සෑමවිටම ප්‍රශස්ත තොග පවත්වාගෙන යාම සිදුකළ යුතුය. 2015 වර්ෂයෙන් පසුව මාර්ග සංවර්ධන කටයුතු එකවර නතර | අමුද්‍රව්‍ය තොග පාලනය සම්බන්ධයෙන් ක්‍රමවේද හඳුන්වා දිය යුතුය. නිෂ්පාදනයේ ප්‍රතිලාභ මැනුම් කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දිය යුතුය. |

| | | |
|---|---|---|
| අංගනය තුල 1,047.97$m^3$ ක වටිනාකම රු.1,819,012 ක් වූ ගල් තොගයක් ඉතිරි වී පැවතුණ අතර, ඇස්පොල්ට් නිෂ්පාදනයේ ප්‍රතිලාභ මැනුම් කිරීමක්ද සිදුවී නොතිබුණි. | කිරීම හේතුවෙන් මෙම තොග භාවිතා කිරීමට නොහැකි වීම අදාල නිළධාරීන්ගේ වරදක් මත සිදුවූවක් නොවන බව. | |
| **(ඇ) අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්** | | |
| දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික සැලැස්මට හෝ අයවැය ලේඛනයට ඇතුළත් නොවූ ප්‍රාදේශීය සභා මාර්ග 07 ක් වැඩිදියුණු කිරීමට අධිකාරියේ මාර්ග නඩත්තු ප්‍රතිපාදන රු.12,059,884 ක් යොදවා ගෙන තිබුණි. ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනවල ඉල්ලීමක්ද නොවූ අතර එය දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අරමුණට ද පටහැනි බව නිරීක්ෂණය විය. එසේ වුවද, ඒ වන විටත් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග 27 ක අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු නිම කළ යුතුව තිබුණි. | වාර්ෂික සැලැස්මට හෝ අය වැය ලේඛනයට ඇතුලත් නොවුනද පළාත් බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වූ මෙම සංවර්ධන කටයුත්ත සඳහා ගරු පළාත් ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය මත සිදුව ඇති බවත් පළාත් මාර්ග සංවර්ධන අධීකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන ඇතැම් මාර්ග මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධීකාරිය මගින් හා පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කරනු ලැබූ මාර්ගද මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදුකරනු ලැබූ අවස්ථා පවතින අතර කිසිදු අවස්ථාවක ආයතන දෙකක් මගින් එකම කර්මාන්තය සඳහා මුදල් යොදවා නොමැති බව. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අරමුණු හා විෂය පථයට අයත් කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කළ යුතුය. |
| **(ඉ) හඳුනාගන්නා ලද පාඩු** | | |
| දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගලගොඩ වැඩ අංගනයේ සවිකර තිබූ ඇස්පෝල්ට් යන්ත්‍රය වෙන්දේසි කිරීමේදී තක්සේරු කාර්යය සඳහා පත්කල කමිටුවට විශේෂඥ දැනුම සහිත බාහිර පාර්ශවයකින් එක් සාමාජිකයෙකු හෝ පත්කර නොතිබුණි. එම කමිටුව මඟින් වත්කම සඳහා ලබාදුන් තක්සේරුව රු.10,400,000 ක් වුවද යන්ත්‍රය වෙන්දේසියේදී රු.21,100,000 කට අලෙවි වී තිබුණි. ඒ අනුව තක්සේරු වටිනාකම නිවැරදි නොවන බව සනාථ විය. තවද තක්සේරු කිරීමේදී යන්ත්‍රය තුල වූ තාර ලීටර් 21,782 ක් හා ඩීසල් ලීටර් 4,028 ක් පිළිබඳ සැලකිල්ලට නොගෙන තක්සේරු කර තිබීමෙන් අධිකාරියට රු.3,274,784 ක පාඩුවක්ද සිදු වී තිබුණි. | දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීතිඥ සහාය ඇතිව මේ සම්බන්ධව නීත්‍යානුකූල කටයුතු සිදු කර ගෙන යන බවත් මේ සම්බන්ධයෙන් වූ විගණන විමසුමට අනුව අධිකාරිය මඟින් දැනට යන්ත්රය භාරව සිටි නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරගෙන යනු ලබන අතර 2023 මාර්තු 24 දින පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේදී ලබා දුන් නියෝග අනුව මේ සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 19 දින අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කොට, ඒ සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට 2023 අප්‍රේල් 20 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීම් කොට ඇති බව. | පරීක්ෂණ කටයුතු කඩිනම් කර අදාළ පාඩුව අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

### 1.5.10 ශීර්ෂය 309 - දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව අත්තිකාරම් ගිණුමේ ලැබීම් රු.13,911,851 ක් හා අත්තිකාරම් ගිණුමේ ගෙවීම් රු.14,493,833 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය සකස් කිරීමේදී අත්තිකාරම් අයකර ගැනීම් රු.9,083,370 ක්ද අත්තිකාරම් ගෙවීම් රු.10,721,730 ක්ද ලෙස සටහන් කිරීමෙන් ලැබීම් රු.4,828,481 ක් ද ගෙවීම් රු.3,772,103 ක්ද අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ගෙන ඇත්තේ සත්‍ය වශයෙන් මුදලින් ලද ලැබීම් හා ගෙවීම් පමණක් බවත් මාරු නියෝග අනුව ලැබීම් ගෙවීම් අදාළ කරගෙන නොමැති බව. | ප්‍රධාන ලේකම්ගේ ගිණුම් හා ගෙවීම් 03/2022 චක්‍රලේඛයෙහි 07(VI) අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |

**(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | | |
|---|---|---|
| 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CS/A/11-18 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය අනුව පළාත් අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින සියළු ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යා යුතු බව දක්වා තිබුණද, දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 2015 වර්ෂයේ සිට පුද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යමින් පැවතුණ අතර, 2015 පෙබරවාරි සිට 2022 දෙසැම්බර් දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු.25,800,000 ක් ගෙවා තිබුණි. | ගාල්ල නගර සභාව නවීකරණ කටයුතු හේතුවෙන් නගර සභාවේ පවත්වාගෙන ගිය කාර්යාලය ඉවත් කර ගැනීමට සිදු වූ බවත් නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉල්ලා ලිපි යොමුකර ඇති බව. | රජයට අයත් ගොඩනැගිල්ලක කාර්යාලය ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

### 1.5.11 ශීර්ෂය 310- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**(අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 139 | සහතික කිරීමේ බලයලත් නිලධාරියකු විසින් වවුචර් සහතික කිරීමේදී, පවත්නා බැංකු ශේෂය, සියළුම ගෙවීම් පියවීම | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රේඛීය අමාත්‍යාංශ මුදල් පොතට අනුව 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (10) | | සඳහා ප්‍රමාණවත් බව තහවුරු කරගත යුතු වුවත්, 2022දෙසැම්බර් 31 දින රේඛිය අමාත්‍යාංශයේ බැංකු ගිණුමේ ශේෂය රු.13,472,279 ක් පැවතියද රු.32,745,899 ක් වටිනා චෙක්පත් බාහිර පාර්ශවයන් වෙත ලියා තිබුණි. ඒ අනුව බැංකු ශේෂයේ පවත්නා මුදල් ප්‍රමාණය අභිබවා, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් රු.19,273,620 ක් වටිනා චෙක්පත් ලියා තිබුණි. | රු.70,106,281 ක් වූ අතර එදින එම ශේෂය අභිබවා බාහිර පාර්ශවයන් වෙත ගෙවීම් සිදු කර නොමැති බව. |

**(ආ) හඳුනාගන්නා ලද පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, 2001 වර්ෂයේදී, විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සඳහා, පෞද්ගලික ආයතනයක් සමඟ, එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව ගෙවීම් සිදු නොකළ බව දක්වමින් සැපයුම්කරු 2002 වර්ෂයේ නොවැම්බර් මස 15 වන දින දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට එරෙහිව නඩුවක් පවරා තිබුණි. 2019 මැයි 23 දිනැති අභියාචනාධිකරණ නඩු තීන්දුව ප්‍රකාරව සැපයුම්කරුට රු.2,448,734 ක මුදලක් සහ 2021 දෙසැම්බර් 21 දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා ඉහත මුදල මත වසරකට සියයට 34 ක් බැගින් වූ පොලි මුදලක් ගෙවිය යුතු බවට තීන්දු කර තිබුණද නියමිත දිනයේදී අධිකරණ තීන්දුව ප්‍රකාරව ගෙවීම් නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 14 වන දින අදාළ මුදල ලෙස රු.2,448,734 ක් සහ පොළිය ලෙස රු.2,228,327 ක් වශයෙන් එකතුව රු.4,677,061 ක් ගෙවා තිබුණි. | මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | | | |
|---|---|---|---|
| (i) | 2022 වර්ෂයේදී කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල 12 කට අයත් පාසල් 355 ක් අතුරින් පාසල් 225 ක් අධීක්ෂණය සඳහා සැළසුම් සකස් කර තිබුණු අතර ඉන් පාසල් 72 ක් පමණක් අධීක්ෂණයට ලක් කර තිබුණි. ඒ අනුව අධීක්ෂණය කළ යුතු පාසල් සංඛ්‍යාවෙන් අධීක්ෂණයට ලක් වූ පාසල් සංඛ්‍යාව සියයට 32 ක් පමණක් වූ අතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාල 07 ක පසුගිය වර්ෂ 03 ක් තුල එක් වරක් හෝ අධීක්ෂණයට ලක් වී නොතිබුණු පාසල් ගණන 45 ක් විය. ඒ අනුව පාසල් අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි. | 2023 වර්ෂයේ සිට නිසි සැලැස්මකට අනුව අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වන බැවින් කොට්ඨාසයට අදාල සියලු ම පාසල් අධීක්ෂණය කිරීමට කටයුතු කරන බව. | නිසි සැලැස්මකට අනුව සියලු පාසල් අධීක්ෂණයට ලක් කළ යුතුය. |
| (ii) | එක් පාසලක සේවය කළ හැකි කාලය උපරිම අවුරුදු 08 ක් පමණක් වුවද, අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයෙහි අවුරුදු 10 කටත් වඩා එකම පාසලේ සේවය කළ ගුරුවරුන් 137 සහ විදුහල්පතිවරුන් 14 දෙනෙක් සේවය කරමින් පැවතුණි. | 2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්වය නිසා ඒ වන විට එකම පාසලේ සේවා කාලය වසර 10 සම්පූර්ණ කළ ගුරුවරුන්ගේ ස්ථාන මාරු සිදු නොකරන ලද බවත් 2021 වර්ෂයේ පාසලේ තෙවන වාරය 2022 මාර්තු මාසය දක්වා ක්‍රියාත්මක වූ බැවින් 2021 වර්ෂයේදී ද ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව නොලැබුණු බව. | විධිමත් පරිදි ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතුය. |

### 1.5.12 ශීර්ෂය 311 - දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන එම ආයතනවල අරමුණු හා | දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියෙහි ස්ථාවර තැන්පතු තුළ ආදාල ප්‍රඥප්තිගත ආයතන මගින් | අදාළ මුදල් ආයතන අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය. |

| | |
|---|---|
| කාර්යයන් ඉටුකිරිම සඳහා යෙදවිය යුතු වුවත්, රු.23,645,746 ක් වූ අරමුදල් එකී අරමුණු සඳහා යෙදවීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති තුළින් උපයන ලද ආදායම ඇතුළත් බව. |

**1.5.13 ශිර්ෂය 317- දකුණු පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ගාල්ල, මාතර හා හම්බන්තොට සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලවල උසාවි දඩ ලෙස අයකර තිබූ එකතුව රු.40,215,178 ක් වූ නිරවුල් කළ යුතු උසාවි දඩ ශේෂයක් පැවති අතර මෙම මුදල අදාළ ප්‍රතිලාභී සමිති හඳුනාගෙන කඩිනමින් ලබාදීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම, මෙම ශේෂය තුළ 2022 වර්ෂයට පෙර කාලයට අදාළ හඳුනා නොගත් රු.27,837,307 ක් වූ ශේෂයක් පැවතුණි. | උසාවි දඩ නිරවුල් කිරීමේ ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගත වන බැවින් ඒ සඳහා මෘදුකාංගයක් හඳුන්වා දී ඇති බව. | උසාවි දඩ ලෙස අයකර තිබූ මෙම මුදල් ප්‍රතිලාභී සමිති හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ණය ගෙවීම් කිරීමේදී වාරික ලෙස ගෙවීම් කිරීමට ණයකරුවන්ට අධිකරණය මඟින් තීන්දු ලබාදී තිබූ සමූපකාර සමිති 41 කට අදාළ වන රු.7,298,697 ක් වූ මුළු ණය ශේෂයෙන් වාරික නොගෙවීම මත රු.4,750,269 ක් වූ ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයවිය යුතුව පැවතුණි. | නිරවුල් නොවූ ණය සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට අපේක්ෂා කරන බව. | අදාළ ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 319 - දකුණු පළාත් සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 උපවගන්තිය සහ 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | හල්පාතොට නිවර්තන නිවාසයේ නිලධාරියෙකු විසින් එම නිවාසයේ නේවාසික පිරිමි ළමුන් 06 දෙනෙකු ලිංගික අපයෝජනය කිරීමේ සිද්ධියට අදාළව මූලික විමර්ශන පැවැත්විය යුතු බව 2022 අගෝස්තු 08 දින ප්‍රධාන ලේකම් දක්වා තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2023 පෙබරවාරි 16 විගණන දින තෙක් සිදු කර නොතිබුණි. | මූලික විමර්ශනය අවසන් කර කඩිනමින් වාර්තාව ලබා දෙන ලෙස අදාළ මූලික විමර්ශනය සිදුකරන නිලධාරිනිය දැනුවත් කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධි විධානයන්ට අනුව කටයුතු කළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 320 - දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් වාහන 33 හි වටිනාකම තක්සේරු වාර්තාව අනුව රු.160,924,000 ක් වුවද, ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි රු.112,633,481 ක් ලෙස රු.48,290,519 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වාහනවල තක්සේරු වටිනාකම වූ රු.160,924,000 ක් වන ශේෂය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | විගණනයට ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛනය අනුව ප්‍රධාන ලේකම් කාර්යාලය සහ ඊට අනුබද්ධ ආයතනවලට අයත් ඉඩම්වල වටිනාකම රු.274,283,000 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ එම වටිනාකම රු.280,680,000 ක් ලෙස රු.6,397,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ වත්කම් ලේඛනය සකස් කළ පසු තහවුරු කරගත් ඉඩම් වටිනාකම රු.274,283,000 ක් වන අතර ඒ ඇතුලුව අයිතිය තහවුරු කරගත් අනෙකුත් ඉඩම් වටිනාකම් 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ඉඩම්වල වටිනාකම නිවැරදිව තහවුරු කරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයේ ප්‍රධාන ලේකම් කාර්යාලය සතු ගොඩනැගිලි වල වටිනාකම රු.232,405,500 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ගොඩනැගිලිවල වටිනාකම රු.722,772,409 ක් වූයෙන් රු.490,366,909 ක වෙනසක් පැවතුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමින් පවතින අතර මේ දක්වා 232,405,500 ක් වන වටිනාකම හඳුනාගෙන ඇතුළත් කර ඇත.නමුත් මූල්‍ය ප්‍රකාශනය තුල ඇති රු.722,772,409 වටිනාකම අඛණ්ඩව මේ දක්වා පොත්වල පවතින අගය වේ. ඒ අනුව මෙම වත්කම් අගය නිවැරදි වන අතර එම වටිනාකම් වත්කම් ලේඛණයට ඇතුළත් කිරිමට කටයුතු කරන බව. | ගොඩනැගිලි වටිනාකම නිවැරදිව තහවුරු කරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත්, ප්‍රධාන ලේකම් කාර්යාලයේ තනතුරු 08 ක නිලධාරීන් 17 දෙනෙකුට 2019 මැයි මස සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.16,801,524 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අතරින් 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදයට අනුකූල නොවන ලෙස සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් සඳහා රු.2,040,815 ක මුදලක් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 මැයි 16 දිනැති අංක 02 – 2019 දරන චක්‍රලේඛය මත දකුණු පළාතේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව 2019 මැයි මස සිට ගෙවීම් කර ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටු නිර්දේශ ලබා ගෙන ඇති බව | ජාතික ප්‍රතිපත්ති හා රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. |

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | දිගින් මීටර් 80 ක් වූ දකුණු පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉදිරිපස පැති බැම්ම ඉදිකිරීම සඳහා රු.38,634,000 කට ඇස්තමේන්තු කර තිබූ අතර ඒ අනුව තෝරා ගත් කොන්ත්‍රාත්කරු සමඟ 2021 අගෝස්තු 02 දින රු.37,362,562 වටිනාකමකට (වැට් රහිත) ගිවිසුම්ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මෙම ඉදිකිරීම් කර්මාන්තයේ සම්පූර්ණ වැඩ අවසන් කිරීම 2022 මාර්තු 30 දින දක්වා දින 240 ක කාලයකින් සිදු කිරීමට 2021 අගෝස්තු 02 දින ගිවිසුම් ගත වී තිබුණි. එසේ වුවද, 2022 ජුලි මස 27 දින ඉදිකිරීම් කර්මාන්තයේ කොටසක් පමණක් නිමකර වැඩ අවසන් කිරීමට තීරණය කර එම නිමකළ වැඩ සඳහා රු.15,655,317 ක මුදලක් ගෙවීම් කර ඉහත ගිවිසුම අවලංගු කර තිබුණි. පසුව ඉතිරි වැඩ සඳහා රු.42,958,188 ක නව ඇස්තමේන්තුවක් දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ අතර, ඒ සඳහා නැවත මිල ගණන් කැඳවා 2022 සැප්තැම්බර් 09 දින ඉහත පළමු කොන්ත්‍රාත්කරු සමඟම රු.34,368,110 කට ගිවිසුම්ගත වී තිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් දිගින් දිගටම ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම සහ ඉන්ධන හිඟය හේතුවෙන් ඉතිරි ඉදිකිරීම් කටයුතු කරගෙනයාම අපහසු බව දැනුම් දීම මත ප්‍රධාන ලේකම්ගේ 2022 ජුලි 27 දිනැති අංක CSS/15/02/06/10 දරන ලිපිය මඟින් දෙපාර්ශවයේ එකඟතාවය මත ගිවිසුම් අවලංගු කිරිමට කටයුතු කර ඇත. මෙම කර්මාන්තය සම්බන්ධව 2022 අගෝස්තු 02 දින ප්‍රධාන ලේකම් කාර්යාලයේ පැවති සාකච්ඡාවේදී ඉදිකරන ලද පැති බැම් කොටසේ පිටුපස පස් පුරවා කර්මාන්තය නිම කිරිම සුදුසු බව සාකච්ඡා වූ බැවින් එම වැඩ කොටස් ඉටු කරවා ගැනිම සඳහා 2022 අගෝස්තු 15 දක්වා කාලය දීර්ඝ කිරීම සිදු කර ඇති අතර ඒ අනුව ගිවිසුම අවලංගුකළ අතර ඉතිරි ඉදිකිරීම් සඳහා නව ඇස්තමේන්තුවක් සකස් කිරීමට තීරණය කළ බැවින් ඉතිරි වැඩ සඳහා රු.42,958,188 ක ඇස්තමේන්තුවක් සකස්කර පළමු කොන්ත්‍රාත්කරු සමගම රු.34,368,110 ක ගිවිසුමකට එළඹ ඇති බව. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව වැඩ ඉටුකරවා ගැනීමටත් රජයට අවාසියක් නොවන පරිදි කොන්ත්‍රාත්තුව කළමනාකරණය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | එමෙන්ම, දෙවන ගිවිසුම පරිදි රු.34,368,110 ක්ද, පළමු ගිවිසුමේ ඉටුකළ වැඩ සඳහා රු.15,655,317 ක් හා අමතර වැඩ සඳහා රු.9,242,433 ක් ඇතුළුව රු.59,265,860 ක මුළු පිරිවැයක් දැරීමට සිදු වීම මත පළමු ඇස්තමේන්තුවට වඩා රු.20,631,860 ක වැඩි පිරිවැයක් දැරීමට සිදු වී තිබීමෙන් රාජ්‍ය වියදම් නිසි පරිදි කළමනාකරණය කිරීමක් සිදු වී නොතිබුණි. | අමුද්‍රව්‍ය මිලගණන් ඉහලයෑම සහ ඉන්ධන හිඟය හේතුවෙන් කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් සිදුකිරීමට නව ඇස්තමේන්තු සකස් කළ අතර රු.34,368,110 කට ගිවිසුම් ගතවී ඉතිරි ඉදිකිරීම් සිදුකර ඇති අතර ගිවිසුම් ගතවීමේදී මිල වැඩිවීම් ගෙවීමට එකඟවී ඇති බැවින් CIDA මිලසූත්‍රය අනුව මිල වැඩිවීම් අනුව ඒ ඒබිල්පතට අදාළව ගෙවීම්කර ඇති බව. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව වැඩ ඉටුකරවා ගැනීමටත් රජයට අවාසියක් නොවන පරිදි කොන්ත්‍රාත්තුව කළමනාකරණය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**1.5.16 ශීර්ෂය 321 - දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයේ තනතුරු 02 ක නිලධාරීන් 02 දෙනෙකුට 2019 මැයි මස සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.4,215,930 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අතරින් 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදයට අනුකූල නොවන ලෙස සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් සඳහා රු.493,960 ක මුදලක් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 මැයි 16 දිනැති අංක 02 – 2019 දරන චක්‍රලේඛය මත දකුණු පළාතේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව 2019 මැයි මස සිට ගෙවීම් කර ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටු නිර්දේශ ලබා ගෙන ඇති බව | ජාතික ප්‍රතිපත්ති හා රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. |

## 1.5.17 ශීර්ෂය 323 - දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත්, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීයෙකුට 2019 මැයි මස සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.1,741,765 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අතරින් 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදයට අනුකූල නොවන ලෙස සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් සඳහා රු.210,390 ක මුදලක් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 මැයි 16 දිනැති අංක 02 – 2019 දරන චක්‍රලේඛය මත දකුණු පළාතේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව 2019 මැයි මස සිට ගෙවීම් කර ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටු නිර්දේශ ලබා ගෙන ඇති බව | ජාතික ප්‍රතිපත්ති හා රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. |

## 1.5.18 ශීර්ෂය 324 - දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

(අ)

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තනතුරු 01 ක නිලධාරීන් දෙදෙනෙකුට 2019 මැයි මස සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.1,483,503 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අතරින් 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදයට අනුකූල නොවන ලෙස සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් සඳහා රු.237,668 ක මුදලක් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 මැයි 16 දිනැති අංක 02 – 2019 දරන චක්‍රලේඛය මත දකුණු පළාතේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව 2019 මැයි මස සිට ගෙවීම් කර ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටු නිර්දේශ ලබා ගෙන ඇති බව | ජාතික ප්‍රතිපත්ති හා රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. |

**(ආ) මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තල්ගස්යාය තේ කර්මාන්ත ශාලාව පිහිටි ඉඩම වෙනත් පාර්ශවයකට පැවරීමට අදාළව පළමු තක්සේරු වටිනාකම රු.354,150,000 ක් වූ අතර, ඒ සඳහා අභියාචනා කළ පසු දෙන ලද තක්සේරු වටිනාකම රු.276,000,000 ක් වීමෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සමාන ශ්‍රේණියක නිලධාරීන් දෙදෙනෙකු අවස්ථා දෙකකදී දෙන ලද තක්සේරු වටිනාකම් අතර රු.78,150,000 ක පරස්පරතාවයක් පැවතුණි. මේ සම්බන්ධ විගණන විමසුමෙන් අනතුරුව පළාත් ආදායම් කොමසාරිස් විසින් පත්කරන ලද විශේෂ කමිටුව විසින් එම දේපල වටිනාකම රු.248,000,000 ක් ලෙස නැවත තක්සේරු කර තිබීමෙන් දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා විධිමත් නිර්ණායක සකස් කිරීමකින් තොරව එක් එක් නිලධාරියාගේ අභිමතය පරිදි තක්සේරු වටිනාකම් ලබා දී තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මත ප්‍රකාශනය මගින් ලබා දෙන ලද තක්සේරු වටිනාකම් දෙකෙහි වෙනසක් පවතින බව පිළිගනු ලබන බවත්, දෙපාර්තමේන්තුව තුළ එතෙක් පැවති ක්‍රමවේදයන්, සමාලෝචනය කර විධිමත් නිර්ණායකයන් සකස් කිරීමට 2022 දෙසැම්බර් 16 දින කමිටුවක් පත් කරන ලදී. එම කමිටුවේ නිර්ණායක හා කාර්ය පටිපාටි 2023 ජනවාරි සිට දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කර ඇත.මේ අනුව ඉදිරියට තක්සේරු කිරීම්වල විචලතාවයන් අවම වනු ඇති බව. | වත්කම් තක්සේරුව නිශ්චිත නිර්ණායක පදනම් කරගෙන සංගතභාවයකින් යුතුව කටයුතු සිදු කළ යුතුය. |

## 1.5.19 ශීර්ෂය 325 - දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඉලෙක්ට්‍රොනික් ආදායම් බලපත්‍ර (e RL- II Phase two smart office) ව්‍යාපෘතිය සඳහා 2018 මාර්තු මස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය සමඟ එකඟතා ගිවිසුමකට එළඹ රු.5,720,000 ක් ගෙවීම් කර තිබුණු අතර, 2022 අප්‍රේල් මස වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත වුවද | මෙය මුළු දිවයිනම ආවරණය වන පරිදි පළාත් 09 හි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමකි. ඒ සඳහා දකුණු පළාත් මොර්ටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු වූ රු.9,431,497 ක මුදලින් මූලිකව ගෙවිය යුතුවූ රු.5,720,000 ක මුදල එකඟතා | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය කඩිනමින් නිම කර අපේක්ෂිත ආදායම් නිසි පරිදි කළමනාකරණය කිරීම සහ එකතු කිරීම කළ යුතුය. |

| | |
|---|---|
| එය අවසන් කිරීමට නොහැකි වී තිබුණි. එම නිසා නැවත බලපත්‍ර මුද්‍රණය කිරීමට රු.3,075,000 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | ගිවිසුමට අනුව ගෙවීම් කර ඇති නමුත් ව්‍යාපෘතිය නියමිත දිනට අවසන් නොවීම මත රු.3,075,000 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවුවත්, දකුණු පළාත් සභාවට 2022 අයවැය මගින් අපේක්ෂිත බලපත්‍ර ආදායම උපයාදීමට අවශ්‍ය සේවාව නොපිරිහෙලා ඉටුකර ඇති බව. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.777,611,691 ක පිරිහීමක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.558,915,389 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1.1 රජයේ ප්‍රදාන**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (පීඑස්ඩීජී), පළාත් සංවර්ධන ප්‍රාදන (පීඩීජි), උපමාන පාදක ප්‍රදාන (සීඊජී) හා අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන උපයෝජනයට අදාළව නිරීක්ෂණ පහත දැක්වේ.

| මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | අක් මුදල් නොලැබීම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 971,000,000 | 485,500,000 | 485,500,000 |
| උපමාන පාදක ප්‍රදාන (CBG) | 125,000,000 | 70,000,000 | 55,000,000 |
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම් වැඩසටහන් (PSSP) | 560,000,000 | 410,000,000 | 150,000,000 |

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දකුණු පළාත් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මධ්‍යම රජයේ ප්‍රදාන ලෙස පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සහ | භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා වී ඇතත් අක් මුදල් ලැබීම සම්බන්ධයෙන් තොරතුරු වාර්තා නොවන බැවින් නිශ්චිත පිළිතුරක් | ප්‍රතිපාදන ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| උපමාන පාදක ප්‍රදාන (CBG) සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම් වැඩසටහන් (PSSP) සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 971, රුපියල් මිලියන 125 ක් සහ රුපියල් මිලියන 560 ක් ප්‍රතිපාදන අනුමත කර තිබුණද, එම ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රුපියල් මිලියන 485.5 ක්, රුපියල් මිලියන 55 ක් සහ රුපියල් මිලියන 150 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය සඳහා ලැබී නොතිබුණි. | ලබා දිමට ප්‍රමාණවත් තොරතුරු නොමැති බව. | |

### 3.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු.මිලියන 1,095.58 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ යෝජනා 1,117 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

| විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද යෝජනා වැඩ ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| | | | | රු.මි |
| (අ) සම්පූර්ණයෙන් නිම කළ | 737 | 178 | 915 | 870.47 |
| (ආ) සියයට 50 කට වඩා අඩුවෙන් නිම කළ | 84 | 02 | 86 | 93.40 |
| (ඇ) සියයට 50 කට වඩා වැඩියෙන් නිම කළ | 47 | 18 | 66 | 87.60 |
| (ඇ) ආරම්භ කර නොතිබූ | 50 | 01 | 50 | 44.11 |
| එකතුව | 918 | 199 | 1,117 | 1,095.58 |

මේ පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ පළාත් නිශ්චිත උපමාන පාදක, නම්‍යශීලි සහ විශේෂ | 2022 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කරන ලද ව්‍යාපෘති සඳහා අක්මුදල් නොලැබීම හේතුවෙන් 2022 | පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගම්මාන වැඩසටහන් සඳහා අනුමත වැඩ යෝජනා 1,117 ක ප්‍රගතිය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ යෝජනා 915 ක් සම්පූර්ණයෙන් අවසන් කර තිබුණු අතර වැඩ යෝජනා 152 ක් ක්‍රියාත්මක වෙමින් පැවති නමුත් වැඩ යෝජනා 50 ක් ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. ඒ අනුව තවදුරටත් වැඩ යෝජනා 172 ක් අමාත්‍යාංශ මට්ටමින් අවසන් කිරීමට පැවතීමෙන් ඒ ඒ අමාත්‍යාංශ මඟින් එකී වැඩ යෝජනා අවසන් කිරීම සම්බන්ධ පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුවී නොතිබුණු බව නිරීක්ෂණය විය. එමෙන්ම, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් නිශ්චිත හා උපමාන පාදක ප්‍රදාන සඳහා අනුමත ප්‍රතිපාදන වලින් දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබුණේ රු.මි 555.5 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් පමණි. | දෙසැම්බර් 31 දිනට රු.මිලියන 205.46 ක අතැති බිල් ඉතිරි වී ඇති අතර එම මුදල් 2023 වර්ෂය සඳහා වෙන්වෙන් ප්‍රතිපාදන යොදා ගෙන නිරවුල් කිරීමට සිදු වී ඇති බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ නිම කරන ලද ව්‍යාපෘති සඳහා අක්මුදල් නොලැබීම හේතුවෙන් රු.මිලියන 205.46 ක් අතැති බිල් ලෙස ඉතුරු වී තිබූ අතර එම මුදල 2023 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන මඟින් නිරවුල්කිරීමට සිදු වී තිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කරන ලද ව්‍යාපෘති සඳහා අක්මුදල් නොලැබිම හේතුවෙන් රු.මිලියන 205.46 ක අතැති බිල් ඉතිරි වී ඇති අතර එම මුදල් 2023 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන යොදා ගෙන නිරවුල් කිරීමට සිදු වී ඇති බව. | පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුකළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන සැලැස්ම සඳහා රු.මිලියන 1,656 ක ප්‍රතිපාදන (අවුරා තැබීම් වලට පෙර) අනුමත කර තිබුණද, වර්ෂය තුළ එම සංවර්ධන සැලැස්ම සඳහා භාණ්ඩාගාරයෙන් ලද මුදල් පිළිබඳ තොරතුරු කිසිවක් සැලසුම් ලේකම් කාර්යාලය සතුව නොතිබුණි. එබැවින් සැලසුම් ලේකම් කාර්යාලය මඟින් සංවර්ධන සැලැස්ම යටතේ වූ ව්‍යාපෘති වල පසු විපරම් කටයුතු සහ ප්‍රගතිය පරීක්ෂාවේදී විධිමත් පරිදි තොරතුරු විශ්ලේෂණය කිරීමට එය බාධාවක් වී තිබුණි. | ඉදිරියේදී අවශ්‍ය තොරතුරු ගෙන්වා ගැනීමට කටයුතු කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) විසින් දන්වා ඇති බව. | පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුකළ යුතුය. |

## 4. කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2001 දරන චක්‍රලේඛය රාජ්‍ය සේවයේ ස්ථානමාරු පිළිබඳ ප්‍රතිපත්තිය පරිදි දීප ව්‍යාප්ත සේවා, ඒකාබද්ධ සේවා, පළාත් රාජ්‍ය සේවා සහ දෙපාර්තමේන්තු සේවා යන සේවාවන්හි නිලධාරීන්ගේ ස්ථානමාරු පිළිබඳ පොදු ප්‍රතිපත්තියක් තිබිය යුතු බව තීරණය කර තිබුණි. ඒ අනුව උපරිම කාල සීමාව වන අවුරුදු 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා වහාම ස්ථාන මාරු ලබාදිය යුතු බව දක්වා තිබුණත් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ 2022 මැයි 31 දිනට වසර 5-13 ත් අතර සේවා කාලයක් සම්පූර්ණ කර තිබූ නිලධාරීන් 19 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණි. | චක්‍රලේඛයේ එසේ සඳහන් කර තිබුණද, 2013 වර්ෂයේදී නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ III වැනි පරිච්ඡේදය ප්‍රකාරව අවුරුදු 05ක් එකම තනතුරේ/ සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම ස්ථාන මාරු ලබා දිය යුතු බවට සඳහන් කර නොමැත.<br><br>එසේම, දකුණු පළාත් සභාවේ නිලධාරීන් සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ස්ථාන මාරු පරිපාටිය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා මේ වන විට ඉදිරිපත් කර ඇති බව. | රාජ්‍ය සේවයේ පොදු ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුය. |

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වියදම් ශීර්ෂ 26 ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනවලින්, එකතුව රු.2,838,988,856 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එම අගයයන් රු.1,120,089 සිට රු.479,951,734 අතර පරාසයක පැවතුණි. | රාජ්‍ය ආයතනවල වියදම් දැරීම දැඩි පාලනයකට ලක් වී තිබීම හේතු වූ බව. | අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගත යුතුය. |
| (ආ) | මූල්‍ය රීති 27.1 ප්‍රකාරව ආණ්ඩුකාරවරයා විසින් අලුත් පළාත් සභාවක් රැස්වීම පිණිස කැඳවනු ලැබ ඇති දිනය හෝ පළාත් සභා කටයුතු කිරීම | ඡන්දය පවත්වා මන්ත්‍රීවරුන් පත්වූ වහාම ඔවුන්ට රාජකාරී ආරම්භ කිරීමට ප්‍රතිපාදන තිබිය යුතු බව | මෙවැනි අවස්ථාවක ඒ සඳහා නිසි අනුමැතිය ලබාගත යුතුයි. |

නැවත ආරම්භ කරන දිනය හෝ ප්‍රකාශයට පත් කර නොමැති අවස්ථාවක අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩසටහන් 3-1 (අමාත්‍යතුමාගේ කාර්යාලය) සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීම අත්‍යවශ්‍ය නොවුවද, සමාලෝචිත වර්ෂයේ අමාත්‍යතුමාගේ කාර්යාලයට අයත් වැය විෂයන් 20ක් සඳහා, රුපියල් මිලියන 17.651 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම වැය විෂයන් 20 අතුරින්, වැය විෂයන් 10 කට අදාළ ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරිවී තිබුණු අතර, වැය විෂයන් 10 කට අයත් රුපියල් මිලියන 13.305 ක ප්‍රතිපාදන වෙනත් වැඩසටහනක වැය විෂයයන්වලින් මූල්‍ය රීති 30/32 මඟින් මාරු කර ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, ජාතික අයවැය චක්‍රලේඛ මඟින් රාජ්‍ය වියදම් සීමාකර ඇති විටෙක,අත්‍යවශ්‍ය නොවන හා ක්‍රියාත්මක නොවන වැඩසටහන් සඳහා මුදල් වෙන්කර, පසුව එම ප්‍රතිපාදන මූල්‍ය රීතිමඟින් වෙනත් වැඩසටහන් සඳහා මාරු කර ගැනීමේ අරමුණින් යුතුව,අමාත්‍යතුමාගේ කාර්යාලය සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

හා රටේ පැවති උද්ධමනය නිසා වියදම් ඉහළ යාම නිසා ඉතිරිවූ ප්‍රතිපාදන අත්‍යාවශ්‍ය වැය ශීර්ෂ සඳහා මාරු කළ බව.